# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven





FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 12
NUMBER 11

✻ ✻ ✻ ✻ ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත ✻ ✻ ✻ ✻
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

MARCH 10, 2010 මාර්තු මාසය (බුද්ධ වර්ෂ 2553 මැදින් මාසය)
http://www.lankaheritage.com/lankaviththi/


## International Women's Day - March 8 ලෝක කාන්තා දිනය



> යෙහෙළිය, මව, බිරිඳ, පෙම්වතිය ද ලෙසින
> සි ඳ ලි ය නොහෙන ඇල්මෙන් නොහැරම වෙසෙන
> වි දු ලි ය නැති රැයක් ලෙස අඳුරෙන් වැසෙන
> මි හි ලි ය නිසරු වෙයි ඇය නැති දින ඉතින
>
> **As friend, mother, wife and also sweetheart**
> **Her unceasing affection stays not to depart**
> **As a night with no light plunges into deep darkness**
> **World without her would be barren and meaningless**
>
> ♦ *දයා ආනන්ද රණසිංහ* ♦ *Daya Ananda Ranasinghe*

# ප්‍රබල රජයක ලකුණු

♦ **සංජය විමලරත්න විසිනි**

### ජනපතිවරණයට පසු

**2010** ජනවාරි **26** වෙනි දින පැවැත්වුණු ජනපතිවරණ ප්‍රතිඵල පිටවෙනවා සමගම ජනතාව රටට හිතවාදී ප්‍රතිඵලය ගැන උදම්වන්නට වූහ. ඒ සමගම පරාජය උසුලාගත නොහැකිවූ විරුද්ධ පක්ෂයේ ක්‍රියාදාමයන් නිසා සිද්ධීන් රැසක් ඇතිවිය. විපක්ෂයේ පොදු අපේක්ෂක සරත් පොන්සේකා මහතා සිය සහචරයින් සමග කොළඹ මහ හෝටල් දෙකක කාමර අරක් ගැනීමේ සිට ඇතිවූ සිද්ධීන් මත හමුදා වටලෑම්, අත් අඩංගුවටගැනීම්, කුමන්ත්‍රණ චෝදනා සහ ප්‍රතිචෝදනා අස්සේ මාධ්‍ය සහ කොම්පියුටර් බ්ලොග්කාර යින්ටද, පුවත්පත් වලටද ඕනෑ තරම් වැඩ තිබිණ. දිනකින් දෙකකින් සරත් පොන්සේකා හෝටල් කාමර අතැර දමා සිය නිවසට යෑමෙන් පසු මේවා හමාර විය.

### කොම්පියුටර් ජිල් මාට්

නමුත් මේ අතරේ ජනතා විමුක්ති පෙරමුණේ නායක සෝමවංශ අමරසිංහ මහතා දිගින් දිගටම කියා පෑවේ රජයේ මේ ජයග්‍රහණය කොම්පියුටර් ජිල්මාට් එකකින් ලක්ෂ 18 ක වැඩි ඡන්ද ලැබෙන ලෙස රජය කළ ප්‍රෝඩාවක ප්‍රතිඵලයක් බවයි. මේ චෝදනා මගින් ඔවුන් උත්සාහ කළේ එමගින් රජයට පමණක් නොව ඡන්ද කොමසාරිස් දයානන්ද දිශානායක මහතාට මඩගැසීමටය. රටේ ඡන්ද ප්‍රතිඵල දැනට දශක දෙකකටත් වඩා පෙර සිට එම ගණනය භාරව කටයුතු කරන, එමෙන්ම මෙතෙක් රටේ සියළුම ඡන්ද භාරව ඒවා ඉතා නිවැරදිව ගණනය කළ කොළඹ විශ්ව විද්‍යා ලයේ පරිගණක විද්‍යා අංශ ප්‍රධානීන් විද්‍යානුකූලව කරුණු පහදමින් එවැනි ජිල්මාට් පරිගණක පද්ධතීන් මගින් කළ නොහැකි බව පහදාදෙන ලදී. ඉන් පසු ජවිපෙ කල්ලියේ ඒ චෝදනා ගැන ජනතාවගේ පිළිගැන්මක් නැතිවිය. ජිල්මාට් කතාවද රැගෙන සෝමවංශ මහතාද සීඝ්‍රයෙන් පල්ලම් බැස්සේය.

**විදිබැසීම :** මෙයට ටික දිනකට පසු සුපුරුදු පරිදි ජවිපෙ ප්‍රමුඛ හංස සන්ධානය ජනපති ඡන්ද ප්‍රෝඩාවට එරෙහිව උද්ඝෝෂණය සඳහා වීදි බසින ලෙස ඇරයුම් ප්‍රචාරය කොට පෙබරවාරි 3 වනදා කොළඹ දී පෙලපාලියක් පැවැත්වූහ. විසි තිස් දහසක් කොළඹට ගෙන්වන බව කී නමුත් එවැනි සෙනගක් ආවේ නැත. ඔවුන් අදහස් කළේ රටේ මුළු ජනතාව වීදි බැස්සීමට විය හැකිය. එහෙත් එය සාර්ථක නොවීය. මෙහිදී පැහැදිලිව පෙනුණ දෙයක් නම් ඡන්ද ප්‍රතිඵල නිවැරදියයි රනිල් වික්‍රමසිංහ මහතාම පිළිගෙන තිබියදී එක්සත් ජාතික පක්ෂයේ අයද කොළ කොඩි උස්සාගෙන මෙම උද්ඝෝෂණයට එක් සිටීමයි. යූඇන්පියේ බංකොලොත් භාවයද මෙයින් පෙන්නුම් කෙරේ. මෙම හංස සන්ධානය යනු කුමන ආකාරයකින් හෝ බලය ලබාගැනීමේ අරමුණින් පිහිටවූවක් මිස වෙන කිසිදු ජාතික අරමුණක් නැති සන්ධානයක් බව මෙහිදී පැහැදිලි විය.

### සරත් ෆොන්සේකා අත් අඩංගුවට ගැනීම

මේ සියලු සිද්ධීන්ගෙන් දින පහකට පසු, එනම්, පෙබරවාරි 8 වනදා සරත් පොන්සේකා මහතා මිලිටරි අත්අඩංගුවට ගනු ලැබිණ. ඔහුට එරෙහිව දැනට නැගී ඇති ප්‍රධාන චෝදනා වනුයේ **1.** ආණ්ඩුව පෙරලීමේ කුමන්ත්‍රණය සහ ප්‍රයත්නය **2.** රටේ විදේශ විනිමය වංචාකිරීම යි.

මේවා පිළිබඳ විභාගවල දී මෙයට පෙර මා සඳහන් කළ සිද්ධීන්ට අදාල විස්තර ද ජනතාවට ඉදිරියේ එළිදරව් වෙනවා ඇත.

### මහ මැතිවරණයට සූදානම

මේවා මෙසේ සිදුවන අතරතුර නියමිත පරිදි 2010 මහ මැතිවරණය සඳහා පෙබරවාරි 9 වනදා මධ්‍යම රාත්‍රියේ සිට පාර්ලිමේන්තුව විසුරුවා හරින ලදී. අනතුරුව ශ්‍රීලංකා ජන රජයේ හත්වන පාර්ලිමේන්තුව මැතිවරණය සඳහා නාම යෝජනා භාරගැන්ම අරඹන ලද අතර, ඒ සඳහා 2010 පෙබරවාරි 26 වනදා දහවල් 12 දක්වා කාලය නියම කෙරිණ. මහ මැතිවරණය අප්‍රේල් 8 වනදා පැවැත්වීමටත් ඉන්පසු


**4 වන පිටුව බලන්න** ➤





ඔබේ මුදල් අදම යවන්න
අදම ලබාගන්න

FAST CASH
SEND TODAY - COLLECT TODAY

විස්තර පිටු අංක 3